**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ**

**සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ**

**පටිපාටිය**

**01. සම්බන්ධ වන ආයතන**

| | | | | |
|---|---|---|---|---|
| 1.1. | දෙපාර්තමේන්තුව : නීති කෙටුම්පත් සම්පාදක | යොමු අංකය - | LDD/ADM/08/SOR/ALD(CON)/2026 | දිනය : 2026.05.13 |
| 1.2. | අමාත්‍යාංශය : අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා | යොමු අංකය - | MOJ/E08(II)/LDD/ALD(Contract) | දිනය : 2026.05.20 |
| 1.3. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම | යොමු අංකය - | DMS/CAD/DLD/CM | දිනය : 2026.02.09 |
| 1.4. | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය - | EST-2/04/REC/4621 | දිනය: 2026.05.07 |
| 1.5. | ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය - | | දිනය : |
| 1.6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය | යොමු අංකය - | PSC/EST/05-01-63/01/2026 | දිනය : 2026.06.10 |

**02. පත්කිරීමේ බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය:**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදනය කිරීමේ කටයුතු සඳහා නීති කෙටුම්පත් සම්පාදක සේවයේ නිලධාරීන්ට සහාය වීම.

**04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය** : මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කරන ලද තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරීන්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ 2026.05.01 දින සිට 2027.04.30 දක්වා වූ එක් වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා පමණි.

*සටහන* - මෙම තනතුරට බඳවා ගනු ලබන නිලධාරියා රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක විය යුතුය.

**05. මාසික දීමනාව :**

| | |
|---|---|
| මාසික දීමනාව | - රු.115,970/- |
| ජීවන වියදම් දීමනාව | - රු. 17,800/- |

**06.** **කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට අනුමත තනතුරු නාමය, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :**

| *අනුමත තනතුරු නාම* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|
| සහකාර නීති කෙටුම්පත් සම්පාදක (කොන්ත්‍රාත්)<br>ඉංග්‍රීසි / සිංහල මාධ්‍ය - 09<br>ඉංග්‍රීසි / දෙමළ මාධ්‍ය - 03 | 12 | නීති කෙටුම්පත් භාෂාත්‍රයෙන් සකස් කිරීම, උපකාරක නීති ප්‍රතිශෝධනය කිරීම සහ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළ අනෙකුත් කාර්යයන්හි නිරත වන නීති කෙටුම්පත් සම්පාදක සේවයේ නිලධාරීන්ට සහාය වීම හා අවස්ථානුකූලව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරියට අදාළව පවරනු ලබන කටයුතු. |

**07.** **කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ සුදුසුකම් :**

**7.1.** **අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් -**

- ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම

සහ

- අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී සිංහල හෝ දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට විශිෂ්ට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

**7.2** **පළපුරුද්ද** - නීතිඥයෙකු වශයෙන් දිවුරුම්දීමෙන් පසුව වසරක (01) ට නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**7.3** **කායික සුදුසුකම්** - සෑම අපේක්ෂකයෙක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**7.4** **වෙනත් -**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. ශ්‍රී ලංකාවේ නීතිය යටතේ කිසිදු අපරාධ චෝදනාවකට වරදකරුවෙකු වී නොතිබීම.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට, එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08. වයස :**

**8.1 අවම සීමාව** - වයස අවුරුදු 25ට නොඅඩු

**8.2 උපරිම සීමාව** - වයස අවුරුදු 30ට නොවැඩි

**09. බඳවා ගැනීමේ ක්‍රමය :** යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**9.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීම සඳහා සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදාළ නොවේ. |
| 2. භාෂා ප්‍රවීණතාව | 10 | |
| 3. අතිරේක පළපුරුද්ද | 10 | |
| 4.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 | |
| එකතුව | 50 | |

සටහන

i. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන්කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත්, යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටිය අනුමත කිරීම පත්කිරීමේ බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

ii. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුර සඳහා බඳවාගනු ලැබේ.

9.1.1 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා :

" රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් "

**9.2. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :**

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම හා වෙබ් අඩවියේ පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**10. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි** : අදාළ නොවේ.

**11.** **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :** අදාළ නොවේ.

**12.** **ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :** අදාළ නොවේ.

**13.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

**14.** මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කළේ -

අත්සන ..................................

(විෂය භාර නිලධාරියා)

නම - එම්. එන්. අනුෂා

තනතුර - කළමනාකරණ සේවා නිලධාරී I

දිනය - 2026.07.09

පරීක්ෂා කළේ -

අත්සන ..................................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නම - කේ.ඩබ්ලිව්.ඒ.ඩී.එල්.පී. කරුණාසේකර
පරිපාලන නිලධාරී
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
කොළඹ 12.

තනතුර -

දිනය - 2026/07/09

අත්සන ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම -

තනතුර -

දිනය - 2026.07.09

නිල මුද්‍රාව -

දිල්රුක්ෂි සමරවීර
ජනාධිපති නීතිඥ,
නීති කෙටුම්පත් සම්පාදක,
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අංක. 80, අධිකරණ මාවත,
කොළඹ 12.

**15.** **අමාත්‍යාංශ නිර්දේශය :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026.06.10 දින අනුමත කරන ලද නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන - [signature]

නම - ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන

ලේකම්

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

දිනය - 2026.08.11

නිල මුද්‍රාව - ....................................

**16. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමේ පටිපාටිය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026.06.10 දින අනුමත කරන ලදී.

අත්සන - [signature]

නම - ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය - 2026. 8. 24

නිල මුද්‍රාව - ....................................

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

# සහකාර නීති කෙටුම්පත් සම්පාදක (කොන්ත්‍රාත්) තනතුරට පත් කිරීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

01. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අදාළ කරුණු :

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි සහකාර නීති කෙටුම්පත් සම්පාදක (කොන්ත්‍රාත්) තනතුරට බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය

02. ලකුණු ලබා දෙන ආකාරය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. මූලික සුදුසුකම්<br>➢ අ.පො.ස. (සා/පෙළ) විශිෂ්ට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම සිංහල හෝ දෙමළ සහ ඉංග්‍රීසි භාෂාව සඳහා<br>➢ දිවුරුම් දුන් දිනය සහ වෘත්තීය පළපුරුද්ද වසර එකකට නොඅඩු සක්‍රීය නීතිඥ වෘත්තීය පළපුරුද්දක් තිබීම. | ලකුණු ලබා නොදෙන අතර සුදුසුකම් පරීක්ෂාවක් පමණක් සිදු වේ. | |
| 02. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | 25 |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් | 25 | |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබා ගත් පශ්චාත් ඇටර්නි ඩිප්ලෝමාවක් | 20 | |
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද | | |
| ➢ පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| ➢ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| ➢ දෙවන පන්තියේ පහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 07 | |
| ➢ සාමාන්‍ය සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 05 | |
| (ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| (ඉ) නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |
| සටහන : අතිරේක අධ්‍යාපන සුදුසුකම් අතරින් ඉහළම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ඇත. | | |

| | | |
|---|---|---|
| <u>03. භාෂා ප්‍රවීණතාවය</u><br><br>**a)** ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය | | 10 |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධිය | 05 | |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ රජයේ පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 / NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS (Academic) සමස්ත ලකුණ 6.5 හෝ ඊට ඉහළ TOEFL – IBT 79 හෝ ඊට ඉහළ TOEFL – CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL – PBT 550 හෝ ඊට ඉහළ වීම | 04 | |
| **b)** රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය (තනතුරට ඉල්ලුම් කරන භාෂාව හැර) | | |
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සිංහල/දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත් උපාධිය | 05 | |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පුහුණු ආයතනයක සිංහල/දෙමළ භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (අවුරුදු 01ට නො අඩු) | 04 | |
| සටහන : එක් උප ශීර්ෂයක් යටතේ ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ඇත. | | |
| <u>04. අතිරේක පළපුරුද්ද</u><br><br>තනතුරට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබා ගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයෙකු ලෙස කටයුතු කළ වසර 01 ක සේවා කාලයට අමතරව නීතිඥවරයෙකු / නීතිමය තනතුරක් දරන්නෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 02 බැගින් උපරිමය ලකුණු 10ක්<br><br>සටහන<br><br>I. පෞද්ගලික නීති සේවයේ යෙදෙන අයදුම්කරුවන් අවුරුදු විස්සකට (20) නොඅඩු නීතිඥ සේවා කාලයක් සම්පූර්ණ කරන ලද | | 10 |

| | | |
|---|---|---|
| නීතිඥවරයෙකුගෙන් හෝ ජනාධිපති නීතිඥවරයෙකුගෙන් හෝ අධිකරණ සේවා නිලධරයකු වෙතින් ලබාගත් සහතිකයක් මඟින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතුය. රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක නීතිමය තනතුරක් දරන අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධාන වෙතින් ලබාගත් සේවා සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.<br>II. සේවය ආරම්භ වන හා අවසාන වන දින නිශ්චිතව සඳහන් නොවන සේවා සහතික ලකුණු ලබාදීම සඳහා පිළිගනු නොලැබේ. | | |
| 05. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | | 05 |
| මුළු එකතුව | | 50 |

03. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සකස් කළේ -

අත්සන ..................................

(විෂය භාර නිලධාරියා)

නම - එම්.එන්.අනුෂ්

තනතුර - කළමනාකරණ සේවා නිලධාරී I

දිනය - 2026.07.09

පරීක්ෂා කළේ -

අත්සන ..................................

(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නම - කේ.ඩබ්ලිව්.ඒ.ඩී.එල්.පී. කරුණාසේකර

තනතුර - පරිපාලන නිලධාරී<br>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව<br>කොළඹ 12.

දිනය - 2026/07/09

අත්සන ..................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම -

තනතුර -

දිනය -. 2026.07.09

නිල මුද්‍රාව -

දිල්රුක්ෂි සමරවීර
ජනාධිපති නීතිඥ,
නීති කෙටුම්පත් සම්පාදක,
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අංක. 80, අධිකරණ මාවත,
කොළඹ 12.